# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

වී. එන්. තිවාකරන්,
අංක 95/1, ධර්මපාල මාවත,
කොළඹ 07.

අභියාචක

අභියාචනා අංකය : **432/2021**

එදිරිව

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය,
අංක 615, ගාලු පාර, කටුබැද්ද
මොරටුව.

පොදු අධිකාරිය

**ඉදිරිපිටදී** : 1. විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න - සභාපති
2. විශ්‍රාමික විනිසුරු රෝහිණී වල්ගම - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක නැත. ඔහු වෙනුවෙන් ජේසුදාසන් ඩේවිඩ් රාජ් මහතා පෙනී සිටී.
පොදු අධිකාරිය නැත.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නොමැත.
පොදු අධිකාරිය - 2021.03.18

**විභාග කළ දිනය** : 2022.03.02

**තීරණය කළ දිනය** : 2022.03.02

**තීරණය**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2020.09.09 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

> *"2020.02.21 වන දිනෙන් පසු ලෝහ සුන්බුන් හා ලෝහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය සඳහා නිර්දේශ ලබා දීමේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මගින් පරික්ෂා කරන ලද කර්මාන්තශාලාවන් සහ පරීක්ෂණ කමිටු වාර්තා ලබා දෙන ලද ආයතන මොනවාද?"*

තොරතුරු නිලධාරි විසින් 2020.09.21 දිනැති ලිපියක් මගින් පහත පිළිතුරු දක්වා ඇත.

> *"ඔබ විසින් සිදුකර ඇති ඉල්ලීමට අනුව අදාල තොරතුරු කර්මාන්ත හා සැපයුම් කළමනාකර අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බැවින් එම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයෙන් එම තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන මෙන් දන්වමි."*

මෙයින් අතෘප්තියට පත් අභියාචක විසින් 2020.10.06 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරි පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2020.12.04 කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් 2021.03.18 දිනැතිව ලිපියක් කොමිෂන් සභාව වෙත එවමින් *"ලිපියේ සඳහන් පරිදි ඉල්ලා ඇති තොරතුරු වී. එන්. තිවාකරන් මහතා හට ලිඛිතව යොමු කරන ලද බවත්, එම ලිපියේ පිටපතක් මේ සමග ඉදිරිපත් කරන බවත්"* දන්වා ඇත.

**සලකා බැලීම**

මෙම අභියාචනයට පදනම් වූ තොරතුරු ඉල්ලීම මතම, අභියාචක විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා අංක 636/2021 දරණ අභියාචනය විමසීමට ගැනීමෙන් පසුව මෙම කොමිෂන් සභාව විසින් 2022.02.24 වන දින තීරණයක් ප්‍රකාශයට පත් කර ඇත. එකී තීරණය මත මෙම වර්තමාන අභියාචනය (432/2021) පවත්වාගෙන යාම අවශ්‍ය නොවන බවත් එබැවින් ඉල්ලා අස් කර ගැනීමට ඉල්ලා සිටින බවටත් අභියාචකගේ නියෝජිත ප්‍රකාශ කර සිටී. එකී ඉල්ලීම කොමිෂන් සභාව විසින් සළකා බලා වර්තමාන අභියාචනය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන ලදී.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය ප්‍රතික්ෂේප කරන ලදී.